# සෙනෙහෙලතාගේ භාවනාව



අබේරත්න රට යන්න පෙර ඉඳලම අර්ජුන හීන් සීරුවේ පාලුවෙන් අසරණව හිටපු සෙනෙහෙලතාට කිට්ටුවුනේ නියම ගැලවුම් කාරයෙක් විදියට. සෙනෙහෙලතා අබේරත්නගෙන් වෙන්වුනාම අර්ජුන අබේරත්න නම්වූ තමන්ගෙ අතිජාත මිත්‍රයාගේ වේදනාව ගැන බිඳක්වත් හිතුවෙ නැතුව විතරක් නෙවි, සෙනෙහෙලතා බලන්න එන්න පටන් ගත්තෙත් හොරෙන් කියල සෙනෙහෙලතා දැනගෙන නොසිටියට අබේරත්න දැනගෙන හිටිය.

## කෙටි කතාව

**විජයසිරි තිලකුමාර**
බ්‍රිස්බේන්

**සෙනෙහෙලතා** භාවනා කරන්න ඉඳල හිටල පංසලට ගියාට එයාට යන්තම් පනස් පස්වන විය පිරුන විතරක් නෙවි තවමත් තරුන වියේ හැඩ රුවට නෑකම් කියන ලස්සන ගැහැණියක්. එයා නිතරම වාගෙ පිම් එකටත් යනව. ඒක නිසාමද කොහෙද තවමත් එයාගෙ ලස්සණ වියැකිලා නැහැ. මෙහෙම පංසලට ආපු හැමදාම වගේ අන් අයගෙන් ඈත්වෙලා සෙනෙහෙලතා උපේඛාවෙන් භාවනා කරන්න පටන් ගන්නවා. අනික් උපාසකම්මලා වගේ සෙනෙහෙලතා බුද්ධාගමට ඇඳිලා දැන් තියෙන හැම මි ත්‍යා මතයක්ම විශ්වාස නොකරට, බුද්ධාගම දර්ශනයක් වශයෙන් පිලිගන්න කෙනෙක්. කොහොමටත් භාවනාව සවයං මෝහනයක් වුනත්, ඒකෙන් තම සිත දමනය කරගන්න ගමන්ම සැනසිල්ලෙන් ඉන්නත් සෙනෙහෙලතාට උදව්වෙන බව එයා අත්දැකීමෙන්ම දන්නව. මෙහෙම භාවනා කරනකොට සමහර වෙලාවට සෙනෙහෙලතාගෙ සිත ඒකාග්‍රතාවයට නොඑනවා පමනක් නෙවී, එයාගෙ ජාගර සිතේ පහලවෙන අතීතානුස්මරණ හැඟීම් උඩු සිතටත් ගලා එනව.

දැන් ඔස්ට්‍රේලියාවෙ ජීවත් වුනාට සෙනෙහෙලතා උපන්නෙ පිටිසර ගමක උසස් යයි සම්මත පවුලක. ගමේ පාසලේ අධ්‍යාපනය ලැබූ සෙනෙහෙලතා ඉගෙන ගන්න දක්ෂ වුනා විතරක් නෙවී මුලු පාසලේම හිටපු ලස්සනම ශිෂ්‍යාවක් බව කවුරුත් දැන සිටිය කරුනක්. එයා බොහොම ආඩම්බරය කියල හිතපු නිසා කිසිම පිරිමි ලමයෙක් එයා එක්ක වැඩි කථාවට ගියේ නැහැ.

ගමේම හිටිය අබේරත්නලගෙ පවුල ගැන දැන සිටියට, අබේරත්න ගැන පෞද්ගලිකව වැඩිමනක් සෙනෙහෙලතා දැන සිටියෙ නැහැ. ඇරත් අබේරත්න පුංචි කාලෙම ගමේ පාසලෙන් අස්වෙලා නගරෙ තිබුණ පාසලකට ගිය නිසා අබේරත්න ගැන දැනගන්න සෙනෙහෙලතාට අවස්ථාවක් ලැබුනෙත් නැහැ. උසස් පෙල කරණ කාලෙ තමයි සෙනෙහෙලතාට දැන ගන්න ලැබුනෙ, අබේරත්නගෙ හිතේ සෙනෙහෙලතා ගැන හැඟීමක් තිබුනත් එයා සෙනෙහෙලතාගෙ පවුලත් අබේරත්නගෙ පවුලත් අතර තිබුන දැඩි ප්‍රතිවිරුද්ධ භාවය නිසාම ඒක කවදාවත් සෙනෙහෙලතාට කියන්න දිරියකින් නොහිටි බව. හැබැයි ඉතින් සෙනෙහෙලතා මේ විස්තර දැන ගන්නකොට, අබේරත්න ගමෙන් ගොඩක් ඈත මහනුවර පැත්තෙ පාසලකට උසස් පෙල කරන්න ගිහින්.

මේ විස්තර දැනගෙන ටික දවසකින්, සෙනෙහෙලතාටත් හොරෙන් සෙනෙහෙලතාගෙ හිත අබේරත්නට ආදරය කරන්න පටන් ගත්තට මේ ආදරයට කිසිම අනාගතයක් නැති බව සෙනෙහෙලතා නොදැන නොසිටියා පමණක් නෙවී මහා භයකුත් ඇගේ සිත පුරාම ගැවසෙන්නට පටන් ගත්ත. ඒත් අබේරත්න දැඩි අධිශ්ඨානයක් තිබුන කෙනෙක්. එයාට හිතුනෙ කවද හරි මේ ආදරය ජයගනී කියල. මේ අතරෙ සෙනෙහෙලතා උසස් පෙල සමත් වෙලා පේරාදෙනිය විශ්ව විද්‍යාලයට තේරුනා. සෙනෙහෙලතාට සංතෝශයක් ඇතිවුනේ නුවර ඉන්න අබේරත්න හමුවෙන්න මේක හොඳ අවස්ථාවක් නිසා. ඒත් භය හිතුනෙ අබේරත්නට ඔනවට වඩා ලංවෙන එක ගින්දර එක්ක සෙල්ලම් කරනව වගේ වැඩක් නිසා. දෙමව්පියො දැනගත්තොත් කියන භය සෙනෙහෙලතාට සිතට එන කොටත් ඇඟ වෙව්ලුව හැටි මතක් වෙන කොට දැනුත් ඇඟ හිරි වැටෙනව වගේ සෙනෙහෙලතාට දැනෙනවා. අබේරත්න නම් නොසෑහෙන්න සන්තෝශවුනා නිතර දෙවේලේ සෙනෙහෙලතා මුණ ගැහෙන්න පුලුවන් වීම ගැන. ඇයි ඉතින් මේ දෙන්න ගෙම කුලුඳුල් ආදරය නේ.

කොහොම කොහොම හරී අබේරත්න නිතර දෙවේලෙ බලන්න විශ්ව විද්‍යාලයට එන්න පටන් ගත්ත. සෙනෙහෙලතාගෙ භය තිබුනත් ආදරය වැඩෙන්නට පටන් ගත්ත. අබේරත්න විශ්ව විද්‍යාලයට නිතර ආවෙ එයාගෙ මිත්‍රයෙක් වෙන අර්ජුන එක්ක. අර්ජුන නුවර වලව්වක උපන් කෙනෙක්. එයාට වැඩිය මිතුරන් හිටියෙ නැහැ. ඒකට හේතුව එයාගෙ වංශය කබල් ගාන එකයි, දකින දකින ගෑනු ලමය පස්සෙ යන එකයි කියල තමයි අබේරත්න කියන්නෙ. අර්ජුනලගෙ ගෙදර රියදුරෙක් නොහිටි නිසා එයා තමයි ගෙදර තිබුන මොරිස් මයිනර් එකේ රියදුරා උනෙත්. ඒ කාලෙ තරුණ ඉලංදාරියෙකුට කාර් එකක් තියෙනව කියන්නෙ ඉතින් කෙල්ලො පස්සෙ යන්න ලොකු උදව්වක්. ඒත් නුවර හිටිය කෙල්ලො අර්ජුනට අහුවුනේ නැත්තෙ, අර්ජුන ගෙ චරිතය තේරුම් ගන්න තරම් ඒ අය තැලිල පොඩිවෙලා හිටපු නිසයි කියල තමයි අබේරත්න කිව්වෙ. බංඩාර කියල හිටපු අර්ජුනගෙ මිත්‍රයෙක් ගෙ මාමා කෙනෙක් තමයි ඒ දවස්වල මාලිගාව ලඟ තිබුන ආණ්ඩුවෙ ලොකු කන්තෝරුවක ප්‍රධානිය. එයා ගෙ බිරිඳ එයාට වඩා ගොඩාක් තරුණ කාන්තාවක්ලු. අර්ජුන උත්සාහ කරාලු එයා එක්ක සම්බන්ධයක් ඇති කරගන්න. අබේරත්න මේව දැන දැනත් අර්ජුන ආශ්‍රය කලා විතරක් නෙවී සෙනෙහෙලතාටවත් කිව්වෙ නැහැ.

විශ්ව විද්‍යාලයට ඇවිල්ල අවුරුද්දක් විතර ගියාට පස්සෙ, සුන්දර ආදර ලෝකයෙන් එලියට ඇවිත් යථාර්ථය ගැන හිතන්න සෙනෙහෙලතාට සිදුවුනා. සෙනෙහෙලතාගෙ අක්ක කුලහීනයයි සම්මත කෙනෙකු සමග විවාහ වීම නිසා දෙමවුපියො හිටියෙ වේදනාවකින්. මේව ගතානුගතික මිත්‍යාවන් කියල සෙනෙහෙලතා දැන සිටියත්, ලෝකෙ වෙනස් කරන්න ගිහින් දෙමවුපියො වේදනාවට පත්කරන්න තරම් ආත්මශක්තියක් සෙනෙහෙලතාට තිබුනෙ නැහැ. අන්තිමේදි, සෙනෙහෙලතා තීරණය කලා දෙමවුපියො වෙනුවෙන් තමන්ගෙ ආදරය පාවා දෙන්න. මේ තීරණය අබේරත්නට දැන්නුවාම එයා හැසිරුනේ පිස්සෙක් වගේ. එයා සෙනෙහෙලතාට රිදවන දේ පවා කරන්නට පටන් ගත්ත. ඒක එක අතකට සෙනෙහෙලතාගෙ වේදනාව අඩුකරන්න උදව්වුනා. ඇයි එයා ආදරය කරල තියෙන්නෙ තමන් ආදරය කරපු කෙනාට රිදවන්න පුලුවන් කෙනෙකුට කියල සෙනෙහෙලතා හිත හදාගන්න උත්සාහ කලා. ඒත් සෙනෙහෙලතාගෙ මිතුරියො එයාව කොන්කරන්න පටන් ගත්තා, කිසිවරදක් නොකරපු අබේරත්නට බූට් එක දුන්නය කියල. ගමෙන් විශ්ව විද්‍යාලයට ආපු තැලිල පොඩි නොවෙච්ච සෙනෙහෙලතා විශ්ව විද්‍යාලය තුල මානසිකව තනිවුනා.

මේ වෙලාවෙ සෙනෙහෙලතාගෙ තනියට ආවෙ අර්ජුන විතරයි. අර්ජුන බොරදියේ මාලු බාන්න හදන බව තේරුම් ගන්න තරම් සෙනෙහෙලතා තැලිල පොඩිවෙලා හිටියෙ නැහැ. මේ අතරෙ වේදනාවෙන් හිටපු අබේරත්නට ශිෂ්‍යත්වයක් ලැබිල පිටරට ගියේ හරියට බොලඳ නවකථාවක වෙනව වගේ. හැබැයි ඒක ඇත්තටම එහෙම උනා. විශ්ව විද්‍යාලයෙ හිටපු අබේරත්නගෙ යාලුවො සෙනෙහෙලතාට විසුමක් දුන්නෙ නැහැ. මහ රෑට රාමනාදන් හෝල් එක ලඟට ඇවිත් කුණුහරුප කියල කෑගහන්න පටන් ගත්ත. සෙනෙහෙලතා හිතුවෙ මේ සේරම කරන්නෙ අබේරත්නගෙ අනුදැනුම ඇතිව කියලයි. ඒක සෙනෙහෙලතාට වදයක් උනත්, තමා ආදරය කරපු කෙනා මෙතරම් නපුරෙක් නම් එයා අමතක කරපු එකමයි කාරිය කියල හිත හදාගන්න උත්සාහ කලා. මේ ජරමර අස්සෙ සෙනෙහෙලතා විශ්ව විද්‍යාලයෙ අවසාන විභාගයෙනුත් අසමාර්ථ වුනා.

අබේරත්න රට යන්න පෙර ඉඳලම අර්ජුන හීන් සීරුවේ පාලුවෙන් අසරණව හිටපු සෙනෙහෙලතාට කිට්ටුවුනේ නියම ගැලවුම් කාරයෙක් විදියට. සෙනෙහෙලතා අබේරත්නගෙන් වෙන්වුනාම අර්ජුන අබේරත්න නම්වූ තමන්ගෙ අතිජාත මිත්‍රයාගේ වේදනාව ගැන බිඳක්වත් හිතුවෙ නැතුව විතරක් නෙවි, සෙනෙහෙලතා බලන්න එන්න පටන් ගත්තෙත් හොරෙන් කියල සෙනෙහෙලතා දැනගෙන නොසිටියට අබේරත්න දැනගෙන හිටිය. කොහොම කොහොම හරී අර්ජුනගෙ දැලේ පැටලුන සෙනෙහෙලතා අර්ජුනගෙ බිරිඳ වුනා.

ඔහොම අවුරුදු තිස්තුනක් ගෙවිල ගියා. අබේරත්නත් කසාද බැඳල වෙන රටක සන්තෝසෙන් ජීවත් වෙනව. මෑතක දවසක අබේරත්න සමග අහම්බෙන් කථා කරාම තමයි සෙනෙහෙලතා දැන ගත්තෙ සමහර අබේරත්නගෙ යාළුවො කරපු දේවල් අබේරත්න දැන නොසිටිය බව. ඒ දවස්වල තරුණ අබේරත්න සෙනෙහෙලතාට රිදවන්න කරපු සමහර දේවල් වේදනාව නිසාම කරත් ඒ ගැන දුක්වෙන බව සෙනෙහෙලතාට දැන් තේරෙනව. අර්ජුනත් හොඳ පියෙක්. ටිකක් බොන එක තමයි මනුස්සයගෙ තියෙන වැරැද්ද. මිත්‍රයෙකුගෙ වේදනාවේදි එයින් අයුතු ප්‍රයෝජණ ගත්බව කාට බොරු කරත් හර්දය සාක්ෂියට බොරු කල නොහැකි නිසා අර්ජුන බේබද්දෙක් වෙලයි කියල අබේරත්න හිතන බව සෙනෙහෙලතාට දැනෙනව. සෙනෙහෙලතා වල් ගෑනියෙක් කියල, ලංකාවට ආපු අබේරත්නට යාළුවො කිව්වම එයාට ඇතිවෙලා තියෙන්නෙ දුකක්. ලංකාවෙ මිනිස්සු අහිංසක ගෑණියෙකුට පද හදන්න කොච්චර දක්ෂද.

තනියම ඉන්න සමහර වෙලාවට ඩෙපෆඩල් මලේ සිංදුව අහද්දි සෙනෙහෙලතාට මොකක්දෝ වේදනාවක් දැනුනත් ආවචි අම්ම කෙනෙක් වුන මම මොනවද මේ හිතන්නෙ කියල නැවත පියවි ලෝකයට එනව. සදාතනික ආදරයක් කියල එකක් ලෝකෙ නැතුව වගේම ප්‍රථම ප්‍රේමයෙන් පැරදුනේ අබේරත්නයි මමයි විතරක් නෙවේ කියලත් සෙනෙහෙලතාගෙ තර්කාන්වත සිතට හොඳට තේරෙනව. අපි දැන් වයසක මිනිස්සු, සිත දමනය කරගෙන මනුස්ස සවභාවය තේරුම් අරගෙන ජීවත් වෙන්න ඔන කියල සෙනෙහෙලතා තේරුම් අරගෙන ගොඩාක් කල්. ඒත් ජාගර සිතේ කොහේදෝ මුල්ලකින් මම අබේරත්නට තවමත් ආදරෙයි කියල කෑගහනව වගේම අබේරත්නත් මට ආදරෙයි කියල සිහින් හඬක් නැගෙනවා සෙනෙහෙලතාට දැනෙනවා. මනුස්ස ජීවිතය ජරා ජීර්නව අභාවයට යතත්, හදවතක් තුල ඇතිවන ආදරය නම් හැඟීම වියපත් නොවී සදා තාරුණ්‍යයේම පවතීදැයි සෙනෙහෙලතාගේ බුද්ධියට පිටුපසින් සිට කවුදෝ මොර දෙනවා වගේ ඇයට සිතෙන එක වලක්වන්න අමාරුයි.

දෙවියනේ, සෙනෙහෙලතාට පියවි සිහිය ආවෙ දැන්. හිත එක්තැන් කරගෙන හුස්ම ඉහල පහල යන එක ගැන සිතන්න හාමුදුරුවො කියනව ඇහුනෙ මේ දැන්. ඊට කලින් හාමුදුරුවො මොනව කිව්වද සෙනෙහෙලතා දන්නෙ නෑ. අනිත් උපාසක ඇත්තො හිතන්න ඇති සෙනෙහෙලතා දැඩි භාවනාවෙ කියල. නැත්නම් සමහර උපාසක අම්මලට වගේ නින්ද ගිහිල්ල කියල හිතුවද දන්නෙත් නෑ. මොන කෙහෙල්මලක්ද මේ ජාගර හිතේ ඉඳන් වද දෙන සිතිවිලි පහවෙන්න ගෙදර ගිහින් කෙටි කථාවක් වත් ලියන්න ඔන කියල සෙනෙහෙලතා පංසලෙන් පිටවුනා. ■